# ප්‍රේමයේ සමාජයක්

## හතරවන දේව පනත

"නුඹේ පියාටද මවටද ගෞරව කරන්න. එවිට නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝ කාලයක් ජීවත් වන්නෙහිය."

| |
|---|
| ප්‍රේමය තුළ දිවිගෙවන පවුල සමාජයේ කුඩාම ඒකකය පවුලය. |

## කිතුනු පවුලට ශු:පාවුලුතුමාගෙන් උපදෙස්

"දරුවනී ඔබේ දෙමාපියන්ට සමිඳානන් වහන්සේ තුළ කීකරුවන්න. එය ඔබගේ යුතුකමය. "ඔබේ පියාටත් මවටත් ගෞරව කරන්න."

පියවරුනි ඔබේ දරුවන් කෝප නොකරන්න. එසේ නොකර ඔවුන් සමිඳාණන් වහන්සේ තුළ විනයෙන්ද අවවාදයෙන්ද ඇති දැඩි කරන්න."

The National e-learning Portal for The General Education




අන්තර්ගතය - ජී.ඩී.එන්. ප්‍රියන්තා මෙනෙවිය (වැලිකන්න විද්‍යාලය)
සැකසුම - ඒ.ඒ.ඩී.එස්. අමරකෝන් මෙනෙවිය(රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය)

**හතරවන පනතට විරුද්ධ ක්‍රියා**

- දෙමාපිය වැඩිහිටියන් නොසැලකීම, ඔවුන්ට අගෞරව කිරීම.
- මව්පියන්ට හිරිහැරකිරීම, පහරදීම, බැන වැදීම.
- මව්පියන් හුදකලා කිරීම.
- දෙමාපියන් දුන් නිදහස අයුතු ලෙස ප්‍රයෝජන ගැනීම.
- දෙමාපියන්ගේ බලාපොරොත්තු කඩකිරීම.
- ඔවුන්ගේ වස්තුව විනාශකිරීම.

**රාජ්‍ය පාලකයින්ගේ යුතුකම්**

- තම නායකත්වය තුළ පැවරෙන වගකීම් අවංකව හා නිසි අයුරින් ඉටු කිරීම.
- තමන්ගෙන් රටට විය යුතු සේවාව නොපිරිහෙලා ඉටුකිරීම.
- පුරවැසියන්ට සාධාරණය ඉටුකිරීම හා කාරුණිකවීම.
- තම සේවය අවැසි සෑමවිටම සේවයට කැපවීම.
- පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂාකිරීම.
- පුරවැසියන්ගේ නිදහසට ගරු කිරීම.

**පුරවැසියන්ගේ යුතුකම් හා වගකීම්**

- තම හෘදසාක්ෂියට අනුව ඡන්දය භාවිත කිරීම.
- නියමිත ලෙස බදු ගෙවීම.
- පොදු දේපළ පෞද්ගලික පරිහරණයට යොදා නොගැනීම.
- තම වැටුපට වහල් නොවී සේවය අවංකව ඉටුකිරීම.
- පාලනයින් අගය කළයුතු තන්හි අගය කර සහය වීම.
- පාලකයින් වෙනුවෙන් යාච්ඤා කිරීම.

අන්තර්ගතය - ජී.ඩී.එන්. ප්‍රියන්තා මෙනෙවිය (වැලිකන්න විද්‍යාලය)
සැකසුම - ඒ.ඒ.ඩී.එස්. අමරකෝන් මෙනෙවිය(රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය)